# 1 ඉශ්‍රායෙල් දිවැසිවරු

කන්නාඩියක් සූර්ය ආලෝකයට අල්ලා අවශ්‍ය තැනට එම ආලෝකය පරාවර්තනය කිරීමේ හැකියාව ඇත. ඒ අනුව, කන්නාඩියෙන් පරාවර්තනය කරන්නේ කන්නාඩියට පතිත වන ආලෝක කිරණ වේ. කන්නාඩියක් කරන කාර්යය කළ පුද්ගල කණ්ඩායමක් පුරාණ ගිවිසුම තුළ ඇත. ඒ අය නම් "ඉශ්‍රායෙල් දිවැසිවරුන්" ය. දෙවියන් වහන්සේගේ පණිවුඩය ඔවුන් කරා පැමිණි විට ඔවුහු එය ඉශ්‍රායෙල් ජනතාවට ප්‍රකාශ කළහ. පහත පින්තූරයෙන් එය පිළිඹිබු කෙරේ.



1.1 රූපය - දිවැසිවර කැඳවීම

දිවැසිවරයා හෙබ්‍රෙව් බසින් "නබී" ලෙසත් ග්‍රීක බසින් "ප්‍රොෆෙටෙස්" ලෙසත් හැඳින්වෙයි. එහි අර්ථය වන්නේ, "දෙවියන් වහන්සේ වෙනුවෙන් කථා කරන තැනැත්තා" යන්න යි.



පුරාණ ගිවිසුමේ දිවැසිවරුන් ප්‍රධාන කොටස් 2කි.

1. දේශක දිවැසිවරු: මෙම දිවැසිවරුන්ගේ නමින් පුරාණ ගිවිසුමේ ග්‍රන්ථ නොමැත. සාමුවෙල් හා රාජාවලිය ග්‍රන්ථවල ඔවුන් පිළිබඳ තොරතුරු සඳහන් වේ. නාතාන්, එලියා හා එලීෂා යන අය දේශක දිවැසිවරු වෙති.

2. ලේඛක දිවැසිවරු: මෙම දිවැසිවරුන්ගේ නමින් ග්‍රන්ථ, පුරාණ ගිවිසුමේ ඇත. මෙම දිවැසිවරුන් කොටස් 2කි.
   i. ප්‍රධාන දිවැසිවරු
   ii. සුළු දිවැසිවරු

i. ප්‍රධාන දිවැසිවරු:

- ★ යෙසායා
- ★ ජෙරමියා
- ★ එසකියෙල්

ii. සුළු දිවැසිවරු 12කි:

- ★ හොසියා
- ★ ජෝවෙල්
- ★ ආමොස්
- ★ ඔබදියා
- ★ ජෝනා
- ★ මීකා
- ★ නාහුම්
- ★ හබක්කුක්
- ★ ශෙපනියා
- ★ හග්ගයි
- ★ සෙකරියා
- ★ මලාකි

දෙවියන් වහන්සේ වෙනුවෙන් කතා කරන දිවැසිවරයා දෙවියන් වහන්සේගේ හඬට පළමුව සවන් දිය යුතු වේ. දේව ජනතාවට කිව යුතු පණිවුඩය හරියාකාර ව අවබෝධ කර ගැනීමට නම් දේව හඬට නිරතුරු විවෘත විය යුතු ය.

වර්තමාන සමාජයේ දේව හඬ අප වෙත පැමිණෙන ප්‍රබල ම මාධ්‍යය දේව වචනය යි. එලෙස ම දේව හඬ හඳුනා ගැනීමට අපට විවිධ අය ද සහාය වෙති. ඒ අතර පූජක, පැවිදි උතුමන්ලා, දෙමාපිය හා ගුරුභවත්හු සුවිශේෂි වෙති. තව ද කාලයේ සලකුණු දේව හඬ සෙවීමට අපට උපකාරී වේ.


නොමිලේ බෙදාහැරීම සඳහා ය.

දිවැසිවරයා, දෙවියන් වහන්සේ වෙනුවෙන් කතා කරන තැනැත්තකු බැවින්, තමන්ට අවශ්‍ය දේ නොව දෙවියන් වහන්සේට අවශ්‍ය දේ ජනතාවට ප්‍රකාශ කිරීමේ වගකීමෙන් ඔහු බැඳී සිටියි. එනම්, දේව සැලැස්ම ජනතාව වෙතට රැගෙන යාමට දිවැසිවරයා කැඳවීම ලබයි. (ජෙරමියා 1:4-10)

අප සියලු දෙනා ම ප්‍රසාද ස්නාපනය ලැබ ශුද්ධ වූ සභාව තුළ දිවැසිවරුන් ලෙස ආලේප කර ඇත. මෙම කැඳවීමට සාක්ෂි දැරීම ඉතා දුෂ්කර ක්‍රියාවකි. එනමුත් අපි දෙවියන් වහන්සේගේ බලයෙන් ශක්තිමත් වී ක්‍රියාත්මක විය යුතු වෙමු. ඒ අනුව පහත වගකීම් අපට පැවරෙයි:-

- ★ සත්‍යවාදී ව කටයුතු කිරීම
- ★ වැරදි මාර්ගවලට ඇදී යන පුද්ගලයන් ව නිවැරදි මාර්ගයට ගැනීම
- ★ සත්‍යය වසන් කරන අයට අභියෝග කිරීම
- ★ නිවැරදි දේ කිරීමට අන් අයට මග පෙන්වීම
- ★ ශුද්ධ බයිබලයෙහි ඇති පණිවුඩ අන් අයට ප්‍රකාශ කිරීම.

යුගයේ දිවැසිවරුන් වී දෙවියන් වහන්සේගේ සැලැස්ම අද සමාජය තුළ යථාර්ථයක් කරන්නට කැප විය යුතු වෙමු. මඟපෙන්වීමෙන්, නිවැරදි කිරීමෙන්, අභියෝග කිරීමෙන් හා ජීවිත සාක්ෂියෙන් සැබෑ දිවැසිවරු වෙමු.

### ක්‍රියාකාරකම

1. "දිවැසිවරයා" යන්න නිර්වචනය කරන්න.
2. දිවැසිවර වර්ගීකරණය ලියා දක්වන්න.
3. දිවැසිවරයකු ලෙස ඔබට කළ හැකි කාර්යයන් තුනක් ලියන්න.



**ජීවිතයට බිඳක්**

*ඔබේ වචනයෙන්, ක්‍රියාවෙන් හා ආදර්ශයෙන් යුගයේ දිවැසිවරයකු වන්න.*